චක්‍රලේඛ අංක :- 01/2007

මගේ අංකය: බප/සසේකො/ලේ.නිර්/2007
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2007.01.16

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමූපකාර සමිති,
ග්‍රාමීය බැංකු සංගම් හා ස.ණ.ස. සමිති වල
සභාපතිවරුන් වෙත.

**පිරිස්බල තත්සේරු ප්‍රතිශෝධනය කර ගැනීම.**

බොහෝ සමූපකාර සමිති සඳහා අනුමත වී ඇති පිරිස්බල තත්සේරුවල බඳවා ගැනීමේ අවම වැටුප් ක්‍රම සහිත තනතුරු අනුමත වී නොතිබීම නිසා නවක සේවකයින් බඳවා ගැනීමේ දුෂ්කරතා වලට සමිති වලට මෙන්ම මෙම කොමිෂන් සභාවටද නොයෙකුත් අපහසුතා වලට මුහුණ දීමට සිදුව ඇති බව පැහැදිලි කරුණකි.

02. එසේම බොහෝ සමිති වල ඒ ඒ තනතුරු වල උසස්වීම් වලට අදාල ඉහළ වැටුප් පරිමාණ -වලට නවක සේවකයින් බඳවා ගැනීමට යාමේදී අයදුම්කරුවන්ට සුදුසුකම් නොමැති වීම නිසා එම පත්වීම් ලබා දීමට නොහැකි අවස්ථාවන්ද විශාල සංඛ්‍යාවක් ඇත.

03. නිදසුනක් වශයෙන් ගත් කල යම් තනතුරක අවම වැටුප් පරිමාණය 15 වුවත් එම වැටුප් පරිමාණය අනුමත තනතුර පිරිස්බල තත්සේරුවේ නොමැති බැවින් නවක සේවකයින් බඳවා ගැනීමට ඇති ඉඩකඩ ඇහිරී ඇත. ඊට ඉහල ශ්‍රේණිවලට නවකයන් බඳවා ගැනීමට යාමේදී ඔවුන්ට අදාල තනතුරට නියමිත පලපුරුද්ද හා අනෙකුත් සුදුසුකම් නොමැති බැවින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට කොමිෂන් සභාවට සිදුවේ.

04. මෙම තත්වය බ.ප. සමූපකාර කොමසාරිස්/රෙජිස්ට්‍රාර් වෙත යොමු කිරීමේදී කොමසාරිස්තුමාගේ අදහස වී ඇත්තේ මෙම තත්වය ගැටළු සහගත බැවින් සෑම තනතුරකටම අදාල අවම වැටුප් පරිමාණයේ තනතුරු සංඛ්‍යාවක් සුදුසු පරිදි සමූපකාර සංවර්ධන කොමසාරිස්තුමා වෙතින් අනුමත පිරිස්බල තත්සේරුවලට ඇතුලත් කරගත යුතු බවත් ඒ බව සියළු සමූපකාර සමිති වලට දැනුම් දීම සුදුසු බවත්ය.

05. එබැවින් දැනට පුරප්පාඩුව පවතින ඉහල වැටුප් පරිමාණයේ තනතුරු කීපයක් හෝ යටපත් කොට අවම වැටුප් පරිමාණයේ තනතුරු කීපයක් හෝ ඇතිකර ගැනීමට ක්‍රියා කරන ලෙස කොමිෂන් සභාව සියළුම සමිති වලට මෙයින් නියම කරනු ලැබේ. ඉදිරියේදී නවක සේවකයින් බඳවා ගැනීම කළ යුත්තේ අවම වැටුප් පරිමාණ වලට බවත්, අතරමැදි වැටුප් පරිමාණ වලට නවකයින් බඳවා ගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොකල යුතු බවත් කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දැනුම් දෙනු ලැබේ. අතරමැදි ශ්‍රේණි වලට බඳවා ගත හැක්කේ උසස්වීම් සඳහා පමණි.

කේ.කේ. සිරිසේන,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-
1. බස්නාහිර පළාත් සමූපකාර හා පළාත්මාර්ග අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්, සමූපකාර හා පළාත්මාර්ග අමාත්‍යාංශය (බ.ප.)
4. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමූපකාර සංවර්ධන ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
6. ලේකම්, සමූපකාර සේවක කොමිෂන් සභාව
7. සියලුම පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියළුම වෘත්තීය සමිති සංගම්